(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(7).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 සැප්තැම්බර් 25 සිකුරාදා**

---

**2020 ඔක්තෝබර් 06 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 (3) වගන්තිය සහ 14 වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 අප්‍රේල් 16 දිනැති අංක 2171/5, 2020 මැයි 22 දිනැති අංක 2176/19, 2020 ජුනි 30 දිනැති අංක 2182/10 සහ 2020 ජූලි 16 දිනැති අංක 2184/21 දරන අතිවිශේෂ ගැසට්පත්‍රවල පළ කරනු ලැබ, 2020.09.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය අමාත්‍යතුමිය,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග (අංක 1),— (105 අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වගන්තිය සමඟ කියවිය යුතු 19(ඉ) වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 26 දිනැති අංක 2055/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය අමාත්‍යතුමිය,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග (අංක 2),— (105 අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වගන්තිය සමඟ කියවිය යුතු 19(ඉ) වගන්තිය යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 26 දිනැති අංක 2155/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2020 ඔක්තෝබර් 20 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

92/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඓතිහාසික වැදගත්කමක් ඇති උමං මාර්ග ජාලයක් ඇති බවත්;

(ii) මෙම උමං මාර්ග පිළිබඳ නිසි ගවේෂණයක් හා සංරක්ෂණයක් සිදුවී නොමැති හෙයින් විනාශ වෙමින් පවතින බවත්;

(iii) මේ පිළිබඳව ගවේෂණය කර සංරක්ෂණය කිරීමට පියවර ගැනීමෙන් රටේ ආරක්ෂක කටයුතු, ප්‍රවාහන කටයුතු හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා යොදාගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඓතිහාසික උමං මාර්ග පිළිබඳ ගවේෂණය ආරම්භ කිරීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට සොයාගෙන ඇති උමං මාර්ග සංරක්ෂණය කිරීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

115/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කර්මාන්තපුර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් කර්මාන්තපුරයේ පිහිටි කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් කර්මාන්තපුරය තුළ රැකියාවල නිරතව සිටින මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කර්මාන්තපුර තවදුරටත් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

120/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ලබා දී ඇති ආයතනය කවරේද;

(ii) ඉහත ආයතනයට එම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති ක්‍රමවේදය කවරේද;

(iii) ඒ සඳහා කොන්ත්‍රාත් මුදල කොපමණද;

(iv) එම කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා ලබාදී ඇති කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

127/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාතේ පැවති යුදමය වාතාවරණය අවසන් වී වසර දහයක් ගත වුවද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කිලිනොච්චි - මුලතිව් A50 ප්‍රධාන මාර්ගයේ ඇති ප්‍රධාන පාලම වන මීටර 402ක් දිග වට්ටුවාකල් පාලම මෙතෙක් කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් නොකොට එක් වාහනයක් පමණක් ගමන් කළ හැකි පරිදි අබලන් වූ කුඩා පාරක් ලෙස තිබෙන හෙයින් ගමනාගමනයට බාධාවන් ඇති බවත්;

(ii) පසුගිය පාලන සමයේ දී මේ පිළිබඳව මවිසින් බොහෝ අවස්ථාවල මෙම සභාවේ සඳහන් කළ නමුත්, ඒ පිළිබඳව මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත වට්ටුවාකල් පාලම ද්විත්ව තීරු මාර්ගයක් ලෙස ප්‍රතිසංස්කරණය කොට ජනතාවට සාමාන්‍ය පරිදි ගමනාගමනය සඳහා විවෘත කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

344/2020

ගරු මයන්ත දිසානායක මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තේ ශක්ති අරමුදලේ ආරම්භයේ සිට මේ දක්වා ඇති මුදල කොපමණද;

(ii) මෙම අරමුදලෙන් කුඩා තේ වතු හිමියන් සඳහා ලබා දෙන ප්‍රතිලාභ කවරේද;

(iii) තේ ශක්ති අරමුදලේ ආරම්භයේ සිට මේ දක්වා එහි සමාජිකත්වය ලබා ඇති සංඛ්‍යාව කවරේද;

(iv) මෙම අරමුදලට කුඩා තේ වතු හිමියන් විසින් ආයෝජනය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තේ ශක්ති අරමුදල්වලින් තේ කර්මාන්තශාලා ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම කර්මාන්තශාලා සංඛ්‍යාව කවරේද;

(iii) එම කර්මාන්තශාලා ආරම්භ කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) ඒ සඳහා වැයකර තිබෙන මුළු මුදල කොපමණද?

(v) කර්මාන්තශාලා සඳහා ආයෝජනය කළ මුදල්වලින් කිසියම් ලාභයක් ලබන්නේද;

(vi) එසේ නම්, එම ලාභය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

204/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා රෝගීන් දහස් ගණනක් වසර ගණනාවක් තිස්සේ රජයේ රෝහල්වල පොරොත්තු ලේඛනයේ සිටින බවත්;

(ii) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පෞද්ගලික රෝහල්වලින් එම සැත්කම් සිදු කර ගැනීම සඳහා රුපියල් මිලියන ගණනක් දැරීමට සිදු වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) පසු ගිය වසර පහක කාලය තුළදී ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ හෘද ආශ්‍රිත රෝග සංඛ්‍යාව කොපමණද;

(ii) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා පසු ගිය වසර පහක කාලය තුළදී රජයේ රෝහල්වල ලියාපදිංචි වී ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) එසේ ලියාපදිංචි වූ රෝගීන් සඳහා පසු ගිය වසර පහ තුළදී වාර්ෂිකව සිදු කරන ලද සැත්කම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඇ) (i) වර්තමානයේදී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය පිළිබඳව රජය සෑහීමකට පත්වන්නේද; සහ

(ii) දැනට පවත්නා මෙම තත්ත්වය වැඩිදියුණු කර ගැනීම පිණිස ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2020 ඔක්තෝබර් 21 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට හේතු කවරේද;

(iv) අදාළ පුරාවිද්‍යා ස්ථාන විනාශ කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) ඔවුන්ට ලබාදුන් දඬුවම් කවරේද;

(vi) විනාශ කර ඇති, එහෙත් ඊට වගකිව යුතු පුද්ගලයන් හඳුනා නොගත් පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vii) රටක ඓතිහාසික අභිමානය සුරකින පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට එරෙහිව ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

52/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට විදේශගතව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් සේවයේ නියුතු රටවල්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් රටේ සේවයේ නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොවිඩ් - 19 වසංගතය නිසා පීඩාවට පත් වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(ii) ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද?

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

94/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජෛව අවි භාවිතය ලෝකයේ එකඟතාවය මත තහනම් වුවද විවිධ දේශපාලන හා වෙළඳ උපක්‍රම සඳහා රහසිගතව තවමත් භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාව ඇතුළු ඌන සංවර්ධිත රටවල් මෙම ජෛව අවි අත්හදා බැලීම් සඳහා ඉලක්ක වීමේ ඉඩක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජෛව අවි ප්‍රහාර වළක්වා ගැනීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

116/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝවේ දැනට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ඩිපෝව තුළ ඇති සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල බස් රථ ඇණි හා මානව සම්පත වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

121/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මේ දක්වා ගිවිසුම්ගතව ඇති ආයෝජන සංඛ්‍යාව;

(ii) එම ආයෝජනවල වටිනාකම;

(iii) එම ආයෝජනවලින් දැනට වැඩ ආරම්භකර ඇති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 22 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2010 සිට 2018 දක්වා කොළඹ, රත්නපුර, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති ජාතික පාසල්වල 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2010 සිට 2018 දක්වා ඉහත පාසල්වල —

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කොපමණද ;

(ii) එම ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත 6 ශ්‍රේණියට ඇතුළත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 6 ශ්‍රේණියට ඇතුළත් වූ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ඇතුළත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත පාසල්වල වර්ෂ 2010 සිට 2018 දක්වා 6 ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

51/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රථම කොවිඩ් - 19 ආසාදිත රෝගියා වාර්තා වූ දිනය කවදාද;

(ii) එදින සිට අද දක්වා දිනපතා වාර්තා වූ කොවිඩ් - 19 ආසාදිත රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එදින සිට දිනපතා සිදුකරන ලද පී.සී.ආර්. (PCR - Polymerase Chain Reaction ) පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(iv) කොවිඩ් - 19 රෝගය මැඩපැවැත්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

99/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ විල්පත්තු ජාතික වනෝද්‍යානය ප්‍රමුඛ වනාන්තර වැස්ම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වන බවත්;

(ii) මේ වනවිටත් උතුරු මැද පළාත අර්ධ කාන්තාර තත්ත්වයට පත්වී ඇති බවත්;

(iii) මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ සමස්ත දේශගුණයට බලපා ඇති බවත්;

(iv) එහෙයින් නිරන්තරයෙන් ශ්‍රී ලංකාවේ කුමන හෝ පළාතක් ගංවතුර, නියගය, නාය යෑම් ආදී ස්වභාවික ව්‍යසනවලින් පීඩා විඳින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පරිසරය සුරැකීමේ ජාතික ප්‍රතිපත්තින් සකස් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ විද්වත් කමිටුවක් හරහා අධ්‍යයනයක් සිදු කිරීම සුදුසු යැයි එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, එම අධ්‍යයනය සිදු කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

117/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කළ/කරන එක් එක් නිලධාරියාගේ ලිපිනය සහ නිලධාරියාට මාසිකව ගෙවන ලද වැටුප්, දීමනා හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ඔවුන් ලැබූ වැටුප් හා වෙනත් වරප්‍රසාදවලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට ඔවුන්ගේ පාලන කාලය තුළ සමත් වී නැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව තවදුරටත් වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

122/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනයේදී ඉවත් කරන ලද පොල් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොල් ගස් ඉවත් කිරීමේදී ඒවා ලබා දෙන ලද පාර්ශ්වයන් කවරේද;

(iii) ඒ සඳහා භාවිතා කළ ක්‍රමවේදය කවරේද;

(iv) එක් පොල් ගසකට ලබා දුන් මිල කොපමණද;

(v) එමගින් උපයා ගත් මුදල්, භාරයේ පවතින ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 23 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

50/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් විෂයයට අදාළව එම ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට සේවයේ නියුතු ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කය තුළ එක් එක් විෂයයට අදාළව දැනට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

123/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පවරා ගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පවරා ගැනීම සිදු කරන ලද ආයතන කවරේද;

(iii) එම ඉඩම් පවරා ගත් දිනය කවරේද;

(iv) එම ඉඩම් සඳහා ගෙවන ලද වටිනාකම කොපමණද;

(v) එම ඉඩම්වල වටිනාකම තක්සේරු කරන ලද ක්‍රමවේදය කවරේද;

(vi) දැනට එම ඉඩම්වල ඇති පොල් වගාවන්වල නඩත්තුව හා එම ඵලදාවන් ලබාගැනීම සිදු කරන ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 නොවැම්බර් 03 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

49/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් අතරින් දැනට උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව හැදෑරීමේ පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) උසස් පෙළ තාක්ෂණික විෂයධාරාව හැදෑරීමේ පහසුකම් තවදුරටත් බදුල්ල දිස්ත්‍රික්කය තුළ පුළුල් කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 නොවැම්බර් 04 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

53/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා රජය සතුව ඇති සංස්ථා, මණ්ඩල, අධිකාරි වැනි ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ආයතනවල දැනට සිටින සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) එම සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(v) එකී ආයතන මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 නොවැම්බර් 05 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

342/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018/05/11 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් අනුව විගණන පරීක්ෂක සේවයේ II ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීම - 2018 සඳහා විවෘත තරග විභාගයක් පැවැත්වූ බවත්;

(ii) එම තරග විභාගය 2018 ඔක්තෝම්බර් 14, 20 සහ 21 යන දිනයන්හි විභාග මධ්‍යස්ථාන කිහිපයකදී පැවැත්වූ බවත්;

(iii) එකී තරග විභාගයේ ප්‍රතිඵල මේ වනතෙක් නිකුත් කර නොමැති බවත්;

(iv) එකී තරග විභාගය පවත්වා මේ වනවිට අවුරුදු 2ට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විභාගයේ ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ට අදාළ පත්වීම් කඩිනමින් ප්‍රදානය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 නොවැම්බර් 06 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

119/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ පිවිසුම් මාර්ගය ඉදිකිරීමේදී හානියට පත්වන දේපළ හා ඒ වෙනුවෙන් අත්කර ගනු ලබන ඉඩම්වලට වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම වන්දිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා තක්සේරුකර ඇති වන්දි ප්‍රමාණය කොපමණද;

(iv) මේ සම්බන්ධව ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත මේ වනවිට ප්‍රතිපාදන නිදහස් කර තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

(vi) එම ප්‍රතිපාදන නිදහස් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

303/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන සඳහා වූ රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවා ඇති පසුබිමක —

(i) ශ්‍රී ලංකාව තුළ බහු විවෘත විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට රජය අරමුණු කර තිබේද;

(ii) රජය විසින් දුරස්ථ ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීමට අදහස් කරන්නේ, උසස් අධ්‍යාපනය ලැබීමට බලාපොරොත්තු වන කවර කණ්ඩායම් ඉලක්ක කරගෙනද;

(iii) දුරස්ථ අධ්‍යාපන අවස්ථා සඳහා සහනාධාර ලබා දීමට ඉදිරියේදීත් රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා එහි අරමුදල් යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) නොඑසේ නම්, එය පාලනයට නතු කරනු ලබන අධිකාරිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?;

(ඇ) (i) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කටයුතු සඳහා වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) විශ්ව විද්‍යාලය සඳහා දරනු ලබන වියදමින් රජය විසින් දරනු ලබන ප්‍රමාණය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?